**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:32/90**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1990 ජුලි මස 30 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන්, දිසාපතිවරුන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත,

## ත්‍රස්තවාදී හා කඩාකප්පල්කාරී ක්‍රියා නිසා විපතට පත් රජයේ සේවකයින්.

මෙම චක්‍රලේඛයට පෙරාතුව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් ලබාදෙනු ලැබූ සහනවලට අමතරව, ත්‍රස්තවාදී හා කඩාකප්පල්කාරී ක්‍රියාවලින් විපතට පත් රාජ්‍ය නිලධාරීන්, සංස්ථා සේවකයන් සහ පළාත් පාලන සේවකයන් පහත දක්වා ඇති සහන වලට ද ඔවනුගේ මාසික ආදායම ගංන නොසලකා හිමිකම් ලැබිය යුතුයැයි රජය තීරණය කර ඇත.

i මරණයක් සම්බන්ධව අවමංගල වියදම් සඳහා මුදලින් රු.2,000.00 ක් (දෙදහසක්)

ii ස්වකීය වාසස්ථාන හැරගොස් නෑදෑ හිතවතුන් සමග සහ සුභසාධක මධ්‍යස්ථානවල තාවකාලිකව වෙසෙන අවතැන් වූ නිලධාරීහු එසේ අවතැන් වූ දින සිට ආසන්න සමූපකාර සමිතියකින් ලබාගත හැකි වියලි සලාකයකට හිමිකම ලබති. මෙය මොවුන්ගේම වාසස්ථානවල නැවත පදිංචි කරවා හය මසක් ගතවෙන තෙක් ලබාගත හැකිය. පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව සතියකට සපයනු ලබන වියලි සලාක ප්‍රමාණයන් පහත දැක්වෙන සටහනෙන් ඇක්වේ.

| පවුලේ සංඛ්‍යාව | ලබාගත හැකි සලාකවල වටිනාකම (රුපියල්) |
|---|---|
| 1 | 55 |
| 2 | 85 |
| 3 | 105 |
| 4 | 125 |
| 5 | 155 |
| 6 | 170 |
| 7 | 185 |
| 8 න් ඉහළ | 200 |

02 මෙම චක්‍රලේඛය ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ එකගත්වය ඇතිව නිකුත් කරන අතර, මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අවශ්‍ය වැඩපිළිවෙල එම අමාත්‍යාංශය විසින් සකස් කරනු ඇත.

අ.කලේ/(ආචාර්ය ජී.ඒ.ටී. ගුණසිංහ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.